# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,502 - 2007 ජූනි 15 වැනි සිකුරාදා - 2007.06.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 572 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 576 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 572 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 577 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |



*සැ. යු.* (i) ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 මැයි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) තාලියවක ශ්‍රී ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධනය) පනත් කෙටුම්පත 2007 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූනි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජූනි මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවයට විදුලියෙන් ක්‍රියාත්මක කරන සින්ක්‍රොනයිස් ස්කෘ ලිෆ්ටින් ජැක්ස් (Electricall Operated Synhronized Screw Lifting Jacks) සැපයීම, පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ටෙන්ඩරය
ටෙන්ඩර් අංක එස්. ආර්. එස්. එෆ්. 6548

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයට විදුලියෙන් ක්‍රියාත්මක කරන සින්ක්‍රොනයිස් ස්කෘ ලිෆ්ටින් ජැක්ස් සැපයීම, පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, නිෂ්පාදකයින්ගෙන් හා / හෝ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිල ගණන් ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද නියෝජිතයෙකු මාර්ගයෙන්ද ඉදිරිපත් කළ හැක.

02. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය 2007.07.19 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) වේ.

03. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල වලින් 2007.07.17 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) තෙක් ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවා ලබාගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

04. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ විගස ශ්‍රී ලංකාව, කොළඹ 10 හි පිහිටි දුම්රිය මූලස්ථානයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට සහභාගී වීමට අවසර දෙනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර්පත් අය කිරීමකින් තොරව පරීක්ෂා කළ හැක.

07. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකතන අංක : 94(11)2432044 හෝ 94(11)2436818.

යොමු අංකය : එස්. ආර්. එස්./එෆ්. 6548.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව.

06-296

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - පානදුර

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාල රාජ්‍යසන්තක කරන ලද හිමිකම් නොකියන ලද සහ නඩු අංක සොයා ගත නොහැකි පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2007.06.09 දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම වෙන්දේසිය කරුණු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳ වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 ට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයා ගෙන් අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිවේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියළුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුය. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිලි ගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පතද ඉදිරිපත් කළ යුතුය.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ජගත් ඒ. කහඳගමගේ,
(මහෙස්ත්‍රාත් පානදුර).

2007 මැයි මස 07 වැනි දින,
පානදුර,
මහෙස්ත්‍රාත් අධිකරණයේදීය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | ඒආර්/894/06 | අංක 118-6465 ය. පැදිය |
| 02. | ඒආර්/823/06 | අංක 100 -8368 ය. පැදිය |
| 03. | ඒආර්/822/06 | අංක 149 -0569 ය. පැදිය |
| 04. | ඒආර්/811/06 | අංක ඩබ්. පී කේ. 1209 දරන පැ. ය. |
| 05. | ඒආර්/732/06 | අංක 85-1677 ය. පැ. |
| 06. | ඒආර්/529/06 | අංක 117-8738 ය. පැ. |
| 07. | ඒආර්/531/06 | අංක 104-0191 යැ. පැ. |
| 08. | අංක රහිත | අංක 114-3557 අබලන් ය. පැ. |
| 09. | ඒ.ආර්/96/06 | අංක 111-9603 ය. පැ. |
| 10. | 55112 | අංක 104 - 8707 ය. පැ. |
| 11. | 63721 | අංක 91-3935 ය. පැ. |
| 12. | 57381 | චැසි අංක ටී - 50 - 673714 දරන යමහ ය. පැ. |
| 13. | ඒආර්/974/05 | අංක 140 -3966 දරන ය. පැ. |
| 14. | ඒආර්/226 | අංක ඩබ්පී - 3264 ය. පැ. |
| 15. | ඒ. ආර්. 524 | චැසි අංක සීඑජ් 50ඊ-2791075 දරන හොන්ඩා වර්ගයේ ය. පැ. |
| 16. | 53203 | අංක 140 -2079 ය. පැ. |
| 17. | 54652 | අංක 105 -9982 ය. පැ. |
| 18. | ඒආර්/78/07 | අංක 110 -3655 දරන රතුපාට චැලි වර්ගයේ හොන්ඩා යතුරු පැදිය |
| 19. | ඒආර්/259/07 | අංක 117-4335 දරන යමහ වර්ගයේ කලු පාට ය. පැ. |
| 20. | ඒආර්/263/07 | අංක 153-2037 දරන හොන්ඩා වර්ගයේ සීඩී 125 ටී (බෙන්ට්ලි) කලුපාට ය. පැදිය |
| 21. | ඒආර්/264/07 | ඩබ්පීඑච්සී 8708 අංක දරන ටිහර් වර්ගයේ අබලන් ය. පැ. |
| 22. | ඒආර්/265/07 | 87-3665 අංක දරන යමහා වර්ගය් නිල්පාට ය. පැ. |
| 23. | 69498 | අංක 154-6804 දරන හොන්ඩා වර්ගයේ රතුපාට එම්. ඩී. 90 යතුරු පැදිය |
| 24. | ඒආර්/233/07 | ලි. ප. නොකල හොන්ඩා වර්ගයේ එන්ජින් අංක ඒඑෆ් ඕඑස්ඊ 1413340 දරන රතුපාට ස්කූටර් ය. පැදිය |
| 25. | ඒආර්/21/07 | ස්ටෑන්ඩට් වර්ගයේ පා පැදිය |
| 26. | ඒආර්/155/07 | මවුටන් වර්ගයේ පා පැදිය |
| 27. | ඒ. ආර් 165/07 | පාපැදිය |
| 28. | ඒ. ආර්. 16/07 | පොල් ගෙඩි 14 ක් |
| 29. | ඒආර්/261/07 | පාපැදි 01 යි |
| 30. | ඒආර්/262/07 | පාපැදි 01 යි |
| 31. | ඒආර්/164/07 | පාපැදි 01 යි |
| 32. | 52637 | පාපැදි 01 යි |
| 33. | ඒආර්/523/06 | පාපැදි 01 යි |
| 34. | ඒආර්/883/06 | පාපැදි 01 යි |
| 35. | ඒආර්/868/06 | පාපැදි 01 යි |
| 36. | ඒආර්/715/06 | පාපැදි 03 යි |
| 37. | ඒආර්/560/06 | පාපැදි 01 යි |
| 38. | ඒආර්/564/06 | පාපැදි 01 යි |
| 39. | ඒආර්/563/06 | පාපැදි 01 යි |
| 40. | ඒආර්/528/06 | පාපැදි 01 යි |
| 41. | ඒආර්/731/06 | පාපැදි 01 යි |
| 42. | ඒආර්/573/06 | පාපැදි 01 යි |
| 43. | ඒආර්/130/06 | පාපැදි 01 යි |
| 44. | ඒආර්/131/06 | පාපැදි 01 යි |
| 45. | ඒආර්/132/06 | පාපැදි 01 යි |
| 46. | ඒආර්/136/06 | පාපැදි 01 යි |
| 47. | ඒආර්/526/06 | රන් කැඩුනු මුදු 01 කේ. අකුර කොටා ඇති මුදු 01 |
| 48. | ඒආර්/878/05 | ගෙතුම් හැඩය ඇති රන් මාලය |
| 49. | ඒආර්/527/06 | රන් චේන් 01 රන් පෙන්ඩන් 01 |
| 50. | ඒආර්/877/05 | නයි පෙනය හැඩය ඇති මුදු 01, බෙස්ලට් 01, පෙති 08 ක් ඇති පෙන්ඩන්ට් 01 |
| 51. | ඒආර් 530/06 | රන් ගැහැණු මුදු 01 |
| 52. | 94325 | රන් චේන් 01 |
| 53. | 65953 | සවල් 02 |
| 54. | 64728 | සවල් 01, ඇලුමිනියම් තාච්චි 01 |
| 55. | 43203 | සවල් 01, තාච්චි 01 |
| 56. | 63204 | තාච්චි 01 |
| 57. | 63827 | තාච්චි 01 |
| 58. | 63825 | තාච්චි 01, බැගිල් 06 යේ පාරු 01 |
| 59. | 64373 | සවල් 01, තාච්චි 01, උදලු 01 |
| 60. | 64372 | සවල් 01, තාච්චි 01 |
| 61. | 66309 | සවල් 01, තාච්චි 01 |
| 62. | 66310 | සවල් 01 |
| 63. | 65188 | සවල් 01 |
| 64. | 57129 | සවල් 02, බ්ලොක් ගල් 101 |
| 65. | 64844 | 10 ලෙස සඳහන් තරාදිය (තැටිය හා යකඩ කොකු 02) |
| 66. | අංක රහිත | හිස් බෝතල් තොගයක් සහ කෑන් |
| 67. | අංක රහිත | හිස් බියර් කේස් |
| 68. | 65646 | ඔරු 01 |
| 69. | 61460 | ජ්ලේන් තහඩු කීපයක් |
| 70. | අංක රහිත | යකඩ බැරල් තොගයක් |
| 71. | අංක රහිත | සවල් |
| 72. | අංක රහිත | ඔරු |
| 73. | අංක රහිත | තාච්චි |
| 74. | අංක රහිත | තඹ දහර තොගයක් |
| 75. | අංක රහිත | යකඩ කැබලි තොගයක් |
| 76. | 70777 | නිල්පාට ප්ලාස්ටික් බූලි 12 යි |
| 77. | 61460 | ජ්ලේන් කහඩු කීපයක් |

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අක්කරපත්තුව

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාළ රාජසන්තක කරනු ලැබූ වෙනත් හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 2007.07.14 වැනි දින ප.ව. 9.30 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙක් වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර් මහතාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය යුතුයි.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ප්‍රථම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවකදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුවේ.

05. භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස තමාගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතුය.

06. වෙන්දේසියේදී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුයි. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය බාර ගනු නොලැබේ.

දිසා විනිසුරු

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.
අක්කරපත්තුව.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩවල විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ඒ.ආර්.94/00 | 55675627 ලුමාලා වර්ගයේ පාපැදිය | 01 |
| 02 | ඒ.ආර්.149/04 | අංකයක් නොමැති පාපැදිය | 01 |
| 03 | ඒ.ආර්.153/04 | 017138 ඒ. පාපැදිය | 01 |
| 04 | ඒ.ආර්.153/04 | අංකය අපැහැදිලි පාපැදිය | 01 |
| 05 | ඒ.ආර්.153/04 | ලුමාලා පාපැදිය | 01 |
| 06 | ඒ.ආර්.153/04 | අංකය අපැහැදිලි හීරෝ පාපැදිය | 01 |
| 07 | ඒ.ආර්.153/04 | 15531521 ලුමාලා පාපැදිය | 01 |
| 08 | ඒ.ආර්.153/04 | අංකය අපැහැදිලි පාපැදිය | 01 |
| 09 | ඒ.ආර්.153/04 | අංකය අපැහැදිලි ලුමාලා පාපැදිය | 01 |
| 10. | ඒ.ආර්.153/04 | 55740420 ලුමාලා පාපැදිය | 01 |
| 11. | ඒ.ආර්.153/04 | අංකය අපැහැදිලි මවුන්ටන් පාපැදිය | 01 |
| 12. | ඒ.ආර්.168/04 | අංකය අපැහැදිලි පාපැදිය | 01 |
| 13. | ඒ.ආර්.168/04 | 172-21ජී10763 පාපැදිය | 01 |
| 14. | ඒ.ආර්.218/04 | 164-560එල් 5802 පාපැදිය | 01 |
| 15. | ඒ.ආර්.266/04 | 59-06එල්6925 ඒසියා වර්ගයේ පාපැදි | 01 |
| 16. | ඒ.ආර්. 295/04 | 186-57179890 ලුමාලා පාපැදිය | 01 |
| 17. | ඒ.ආර්.169/05 | 143-560සී 2006 ලුමාලා පාපැදිය | 01 |
| 18. | ඒ.ආර්.364/05 | 150-21ජී10423 පයනියර් පාපැදිය | 01 |
| 19. | ඒ.ආර්.364/05 | 55898046 ලුමාලා පාපැදිය | 01 |
| 20. | ඒ.ආර්.401/05 | 02ඒ 5970 ලුමාලා පාපැදිය | 01 |
| 21. | ඒ.ආර්.403/05 | 39-155672390 ලුමාලා පාපැදිය | 01 |
| 22. | ඒ.ආර්.403/05 | අංකය අපැහැදිලි හීරෝ පාපැදිය | 01 |
| 23. | ඒ.ආර්.432/05 | 06-85ඊ 73184 කාන්තා පාපැදිය | 01 |
| 24. | ඒ.ආර්.467/05 | 56 සී 45718 පාපැදිය | 01 |
| 25. | ඒ.ආර්.682/06 | 55942090 පාපැදිය | 01 |
| 26. | ඒ.ආර්. 717/06 | 06 සී 5963 ලුමාලා පාපැදිය | 01 |
| 27. | 3565 | 21 පී 1049 ලුමාලා පාපැදිය | 01 |
| 28. | 3565 | අංක රහිත පාපැදි (ලුමාලා) | 01 |
| 29. | 3565 | අංක රහිත පාපැදි (හීරෝ) | 01 |
| 30. | 3565 | සී.සී. 1650ඊ (ලුමාලා) | 01 |
| 31. | පී/702 | අංක රහිත පාපැදි | 01 |
| 32. | පී/702 | අංක රහිත පාපැදි | 01 |
| 33. | පී/702 | 02 එප් 29919 පාපැදි | 01 |
| 34. | පී/702 | නොම්බර නැත පාපැදි | 01 |
| 35. | පී/702 | නොම්බර නැත පාපැදි | 01 |
| 36. | 7580 | 24379793 ලුමාලා පාපැදි | 01 |
| 37. | 16258 | සීඑස්. 79744 හීරෝ පාපැදි | 01 |
| 38. | පී/872 | 56 සී ඊ ඊ 643 ලුමාලා පාපැදි | 01 |
| 39. | 6822 | පීසීසී 77785 ලුමාලා පාපැදි | 01 |
| 40. | 6822 | අංක රහිත ලුමාලා පාපැදි | 01 |
| 41. | 6822 | 55781421 ලුමාලා පාපැදි | 01 |
| 42. | 13365/06 | පීසීඅයි 29879 ලුමාලා පාපැදි | 01 |
| 43. | 12297 | අංක රහිත ලුමාලා පාපැදි | 01 |
| 44. | 20539 | ඊ08744 ලුමාලා පාපැදි | 01 |
| 45. | 10671 | 02ඊඑෆ්1511 ලුමාලා පාපැදි | 01 |
| 46. | 13447 | අංක රහිත ලුමාලා | 01 |
| 47. | ඒ.ආර්./822/06 | (1) 357051/00/386943/7 අංක 3100 අංක නොකියා දුරකතන | |
| 48. | ඒ.ආර්.822/06 | (2) 357962/00/826586/අනු අංකය 3220 නොකියා දුරකතන | |
| 49. | ඒ.ආර්.845/07 | 40,80,120,160,200 පිටු සහිත එක්සයිස් පොත් 8500ක් පමණ (කොටසක් පාවිච්චියට ගැනීමට නොහැකි තත්වයේ ඇත) | 8500 |
| 50. | එම | මහන මැෂින් 05 යි (සිංගර්) (එක් මැෂිමක් අබලන් තත්වයේ ඇත) | 05 |
| 51. | 4047 | පිහියා | 01 |
| 52. | 4552 | පිහියා | 01 |
| 53. | 6333 | පිහියා | 01 |
| 54. | 2446 | පිහියා | 01 |
| 55. | පී/102 | උදැල්ල | 01 |
| 56. | 4894 | උදැල්ල | 01 |
| 57. | 4127 | උදැල්ල | 01 |
| 58. | 17612 | උදැල්ල | 01 |
| 59. | 17612 | සවල් | 01 |
| 60. | 17612 | බාල්දි | 01 |
| 61. | 4845 | පොරව | 01 |
| 62. | 4467 | පොරව | 01 |
| 63. | ඒ.ආර්.125 | පොරව | 01 |

06-268

## ශ්‍රී ලංකා පොලිසිය - විශේෂ කාර්ය බලකාය

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. විශේෂ කාර්ය බලකායේ පාවිච්චියෙන් පසු ඉවත් කරන ලද පහත සඳහන් භාණ්ඩ 2007.06.27 වන දින පෙ. ව. 10.30 ට විශේෂ කාර්ය බලකාය, ගෝනහේන, කඩවත යන ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන අතර පෙ. ව. 9.30 සිට පෙ. ව. 10.15 දක්වා වෙන්දේසි භූමියට ඇතුලු විය හැක. තම අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

### විකිණීමට නියමිත භාණ්ඩ

01. වතුර පිල්ටර්, මල්ටි පොට් සහ විදුලි බොයිලේරු
02. තනි සහ යුගල යකඩ ඇඳන්
03. විවිධ මිම් ප්‍රමාණයේ ඉබ් යතුරු
04. බැරල් පම්ප් සිලින්ජර්
05. විවිධ පුටු වර්ග සහ කැරකෙන පුටු (යකඩ, ඇලුමිනියම්)
06. අත් හිරමන
07. විවිධ මිම් ප්‍රමාණයේ ඇලුමිනියම් සාස්පාන්
08. මේස විදුලි පංකා, සිවිලින් විදුලි පංකා
09. හැලජන් ලාම්පු සහ ටියුබ් ලයිට්
10. සයිරන් නලා
11. උදලු, පොරව, විසිකැති, පිහියා වර්ග, රේක්ක, සවල්, අලවංගු, යකඩ තාච්චි, යකඩ කූරු, තඹ පටි සහ පිකැස්
12. වයර් කටර්, කටර් අඬු සහ කොම්පාස් අඬු
13. විවිධ මිම් ප්‍රමාණයේ මිටි වර්ග
14. අත් කියත්
15. ස්ටැබිලැයිසර්
16. යකඩ මේස, කබඩ් සහ යකඩ අල්මාරි
17. විවිධ මිම් ප්‍රමාණයේ ස්විච්
18. කැසට් රේඩියෝ, කැමරා සහ වීඩියෝ කැමරා
19. ඇලුමිනියම් සහ විදුලි කේතල
20. වතුර මෝටර
21. ස්ට්‍රෙප්ලර් මැෂින්
22. ඇලුමිනියම් නැඹිලි, කිරිගොටු, තෙල් තාච්චි, කෝප්ප සහ පිහන් (එනමල්, ඇලුමිනියම්)
23. යතුරු පැදි හිස් වැසුම්
24. ගෑස් ලිප් සහ ගෑස් රෙගුලේටර්
25. ලන්තෑරුම් සහ සර්ච් ලයිට්
26. බෝතල් ශීතකරණ, අධිශීතකරණ සහ ශීතකරණ
27. එලාම් ඔර්ලෝසු සහ මෙගාෆෝන්
28. පීඩන ලාම්පු
29. රූපවාහිනී යන්ත්‍ර, පැක්ස් යන්ත්‍ර සහ ඩෙක් යන්ත්‍ර
30. වතුර බවුසර් ට්‍රේලර්
31. පරිගණක සහ එම උපාංග
32. වායු සමීකරණ යන්ත්‍ර
33. දුරකථන
34. බිම ඔප දමන යන්ත්‍ර
35. තණ කොළ කපන යන්ත්‍ර
36. විවධ ප්‍රමාණයේ ටියුබ්
37. විවිධ මිම් ප්‍රමාණයේ බැටරි තොග 01
38. බර වාහන, සැහැල්ලු වාහන, සහ යතුරු පැදිවලින් ගලවා ඉවත් කරන ලද අමතර කොටස් තොග 01
39. විවිධ මිම් ප්‍රමාණයේ යකඩ බාල්දි සහ ගැල්වනයිස් කුණු බාල්දි
40. විවිධ හැඳි වර්ග
41. විවිධ මිම් ප්‍රමාණයේ නියං, පීරි, ඩ්‍රිල්කටු
42. තෙල් මනින උපකරණ
43. ගෑස් සිලින්ඩර්
44. රොස්ටර් සහ හොට් ප්ලේට්
45. ගිනි නිවන උපකරණ
46. වාහන විල් බ්‍රස්
47. බැටරි චාජර්
48. ප්‍රෙෂර් ප්ලේට්, ක්ලච් ප්ලේට්, හෝන්, බූස්ටර්, වින්ච් කේබල්, හුලං බට පොම්ප
49. දරන පලන කටු, කුඩු ගෙඩි සහ තෙල් ඉසින මැෂින්
50. වැට කපන කතුරු, යකඩ රාක්ක සහ තට්ටු
51. වේන්ජිඕවර් ස්විච්, මාර්ග බාධක, ව්‍යායාම කට්ටල්
52. ගැල්වනයිස් බට, පවර් ගාඩ්
53. රෝනියෝ යන්ත්‍ර, එක්ස්සෙන්ට්‍රිල් කටර්
54. ඡායා පිටපත් යන්ත්‍ර
55. ස්පැනර් අඬු, ගයින්ඩර්, ඩයමන්ට් ආයුධ ඇතුලු උපකරණ
56. විදුලි ජනක යන්ත්‍ර
57. පාපැදි
58. ඇලුමිනියම් ඉනි මං

| | | | |
|---|---|---|---|
| 59. | 1200 x 1250 x 20 | ටයර් | 50 |
| 60. | 900 x 1000 x 20 | ටයර් | 250 |
| 61. | 750 x 16,750 x 206 | ටයර් | 470 |
| 62. | 185 x 600 x 14 | ටයර් | 100 |
| 63. | 155 x 13 x 14 | ටයර් | 100 |
| 64. | 205 x 16 | ටයර් | 50 |
| 65. | 460 x 300 x 17 | ටයර් | 200 |
| 66. | ට්‍රැක්ටර් | ටයර් | 08 |

02. ඉහත සඳහන් වෙන්දේසිය පවත්වන දිනට පෙර එනම් 2007.06.26 වන දින පැය 9.00 සිට පැය 16.00 දක්වා විකිණීමට නියමිත භාණ්ඩ වෙන්දේසි භූමියේදී පරීක්ෂා කර බැලිය හැක.

03. මිල කැඳ වූ වහාම මිලටගත් සෑම භාණ්ඩයක් සඳහාම අත්පිට මුදල් ගෙවිය යුතු අතර චෙක්පත් භාර ගනු නොලැබේ. මිලට ගත් භාණ්ඩ 2007.06.27 වන දින පැය 17.00ට ප්‍රථම වෙන්දේසි භූමියෙන් ඉවත් කරගත යුතු අතර එසේ ඉවත් කර නොගන්නා කිසිම භාණ්ඩයක් සඳහා විශේෂ කාර්ය බලකාය වග කියනු නොලැබේ.

නිමල් ලෙව්කේ,
අණදෙන නිලධාරි,
විශේෂ කාර්ය බලකාය.

06-271

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## දන්කොටුව පෝසෙලේන් ලිමිටඩ්

### ප්‍රකාශ කළ ප්‍රාග්ධනයේ යෝජිත අඩු කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වන වගන්තියේ හා සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 9 (IV) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, සාමාන්‍ය කොටස් 45, 235, 740 කින් නියෝජනය වන රු. 476,006,400 ක් වූ සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය, සාමාන්‍ය කොටස් 22,617,870 කින් නියෝජනය වන රු. 231,529,700 කට අඩු කළ යුතු යයි සමාගමේ කොටස් හිමියන්ට නිර්දේශ කිරීමට දන්කොටුව පෝසෙලේන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ඇති බවට, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී අඩු කිරීම සමාගමේ ඉදිරියට ගෙනෙන ලද පාඩු රු. 244,477,000 ක ප්‍රමාණයකට සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනයට ප්‍රතිපක්ෂව හිලවු කිරීමෙන් සහ සාමාන්‍ය කොටස් 22, 617,870 ක් අවලංගු කිරීමෙන් (එමගින් සමාගමේ එක් එක් කොටස් හිමියා විසින් දරනු ලබන නිකුත් කළ හා ගෙවා නිමි කොටස් වලින් 50% ක් අවලංගු කරනු ලැබේ.) ඉදිරියට ගෙනෙන ලද පාඩු අනතුරුව ශුන්‍ය බවට පත්වන, (2007 මාර්තු මස 31 වන දිනට පැවති පරිදි, සමාගමේ ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති පරිදි) 2007 මාර්තු මස 31 වන දින මුදල් කාර්තුව අවසානයේදී පැවති පරිදි රු. 244,477,000 ක සමාගමේ ඉදිරියට ගෙනන ලද පාඩුවලින් සමාන මුදලක් කපා හැරීමෙන් සිදු කරනු ලැබේ.

ප්‍රකාශ කළ ප්‍රාග්ධනයේ යෝජිත අඩු කිරීම සඳහා විශේෂ යෝජනා සම්මතයක් මගින් කොටස් හිමියන්ගේ අනුමත ලබා ගැනීමේ කාර්යය සඳහා සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් 2007 අගෝස්තු මස 15 වන දිනට කැඳවීමට නියමිතව ඇත.

ජුලියස් ඇන්ඩ් ක්‍රිසි,
දන්කොටුව පෝසෙලේන් ලිමිටඩ් සමාගමේ නීතිඥවරු,
41, ජනාධිපති මාවත, කොළඹ 01.

06-283

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මීගමුව, හලාවත පාර, අංක 410 හි පදිංචි වෛද්‍ය ෆාතිමා සීනා රාසික් වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ඒ. රීසා මහතා විසින් වර්ෂ 2003 ක් වූ මැයි මස 02 වැනි දින සහතික කරන ලද අංක 1084 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කොළඹ, දෙමටගොඩ පාර, අංක 222 හි මොහොමඩ් ආරිෆ් නවාස් (ජා. හැ. අංක : 360540898 ) හිමිකරු වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2007 ක් වූ මැයි මස 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බවත්, ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව මින් ඉදිරියට මොහමඩ් ආරිෆ් නවාස් විසින් එකී ඇටෝර්නි බලකරු ලෙස සිදුකරන කිසිදු ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බව ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

වෛද්‍ය ෆාතිමා සීනා රාසික්.

06-330

---

## විශේෂ ඇටෝර්නි බල පත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ, කඩවත මංකඩ පාරේ අංක 664/4 සහ දැනට ඇමරිකා එක්සත් ජනපදයේ, නිව්යෝක් 10314, ස්ටැටන් අයිලන්ඩ්, බ්‍රැඩ්ලි ඇව්නිව්හි අංක 419 දරන ස්ථානයේ පදිංචි පණ්ඩිතරත්න ලේකම්රාලලාගේ ශ්‍රීමතී විජේසිංහ නැමැති මවිසින්, මොරටුව, රාවතාවත්ත, ශුද්ධ එම්මානුවෙල් පල්ලිය පාරේ, අංක 3/2 දරන ස්ථානයේ පදිංචි මානෙල් අශෝකා ජයසූරිය යන අය වෙත බලය පවරමින්, මොරටුව පදිංචි ගල්කිස්ස ප්‍රසිද්ධ නොතාරිස් දූලවංශ ජයසූරිය මහතා විසින් වර්ෂ 2002.12.02 දින ලියා සහතික කළ අංක 221 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය, වර්ෂ 2007.04.23 දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

පණ්ඩිතරත්න ලේකම්රාලලාගේ ශ්‍රීමතී විජේසිංහ.

06-338/1

---

## ඇටෝර්නි බල පත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ, කඩවත මංකඩ පාරේ අංක 664/4 සහ දැනට ඇමරිකා එක්සත් ජනපදයේ, නිව්යෝක් 10314, ස්ටැටන් අයිලන්ඩ්, බ්‍රැඩ්ලි ඇව්නිව්හි අංක 419 දරන ස්ථානයේ පදිංචි පණ්ඩිතරත්න ලේකම්රාලලාගේ ශ්‍රීමතී විජේසිංහ නැමැති මවිසින්, මොරටුව, රාවතාවත්ත, ශුද්ධ එම්මානුවෙල් පල්ලිය පාරේ, අංක 3/2 දරන ස්ථානයේ පදිංචි මානෙල් අශෝකා ජයසූරිය යන අය වෙත බලය පවරමින්, මොරටුව පදිංචි ගල්කිස්ස ප්‍රසිද්ධ නොතාරිස් දූලවංශ ජයසූරිය මහතා විසින් වර්ෂ 2002.12.02 දින ලියා සහතික කළ අංක 222 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය, වර්ෂ 2007.04.23 දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

පණ්ඩිතරත්න ලේකම්රාලලාගේ ශ්‍රීමතී විජේසිංහ.

06-338/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - නුගේගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ 1999.06.22 දින සහ අංක 589 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම බුද්ධකෝරළලාගේ චන්ද්‍රප්‍රිය තේවිකුම ඩයස් විජේතිලක යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 ජූලි මස 9 වන දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ පිහිටි ඊ. ඩබ්. පෙරේරා මාවත නමින් ද හඳුන්වනු ලබන කෝට්ටේ පාරේ, වරිපනම් අංක 418 /2 දරන අගලබෝගොඩවත්ත *හෙවත්* 'කැටකැලගහවත්ත' නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එම්. එල්. එන්. පෙරේරා විසින් මැන සාදන ලද 1997 ඔක්තෝබර් මස 01 දිනැති අංක 415 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද විශාලත්වය පර්චස් 4ක් වූ ලොට් ඒ දරන ඉඩම.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.12.01 දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2007.01.09 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%)ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%)ද,
4. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහිතක කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියක් (රු. 500)ද,
6. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදලක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාවන් සහ වෙනත් තොරතුරු විමසීම සඳහා කළමණාකරු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකතන අංක : 2661815, 2661816.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

06-329

---

## මහජන බැංකුව - යක්කල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

යක්කල, අලුත්ගම, දිමුතු මාවත, වරිපනම් අංක 34/14 හි පිහිටි දෙමහල් නිවසක් සහිත පර්චස් විසිහතර (අ. 0, රූ. 0, පර්. 24) ක ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2007.07.06 වන දින පෙ.ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2005.07.15 දිනද, ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත් වල 2006.10.20 දිනද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම .– යක්කල නගරයේ සිට ගම්පහ දෙසට යන විට යක්කල නගරයට ආසන්නව දකුණු පසින් ඇති දිමුතු මාවතේ සැ. 1/2 ක් පමණ ගමන් කළ විට හමුවන දෙවන තුංමංහන්දියෙන් පල්ලමට (පාර අවසානයේ) ඇති දෙමහල් නිවස සහිත ඉඩම.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරුවන් විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක්
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප III කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකතන අංකය : 033-2222325, 033-2226741.
ෆැක්ස් අංකය : 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001 - 2000 තත්ව සහතිකය ලත් ශ්‍රී ලංකාවේ
පිළිගත් පුරෝගාමී, වරලත් වෙන්දේසිකරුවෝ
සහ තක්සේරුකරුවෝ අපගේ සේවාව දීප ව්‍යාප්ත සේවාවකි.

*ප්‍රධාන කාර්යාලය*
අංක : 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකතන අංකය : 081-2227593.
ටෙලි/පැක්ස් අංකය : 081-2224371.
E-mail : schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ වෙන්දේසි ශාලාව*
අංක : 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකතන අංක : 011-2502680/011-2585408.
ටෙලි/ෆැක්ස් අංකය : 011-2588176.
E-mail : schokman@samera1892.com

06-324

---

## සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, සල්පිටි කෝරලේ මහරගම නගර සභා සීමාව ඇතුළත, මහරගම ගමේ, නාගහවත්ත පාරේ, වරිපනම් අංක 139 දරන ස්ථානයෙහි පිහිටි, බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් මැන සාදන ලද අංක 7374 හා වර්ෂ 2001 ක් වූ ජුනි මස 14 වැනි දිනැති පිඹුර ප්‍රකාර නාගහවත්ත, නමැති ඉඩමෙන් ලොට් 8, වශයෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල. ප්‍රමාණය පර්. 20.5 එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ සියළුම දේ සමග වේ.

ඉහත කී මහරගම ගමේ පිහිටි, නාගහවත්ත, නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 1290 හා වර්ෂ 1967.09.06 වැනි දිනැති පිඹුර ප්‍රකාර, ලොට් ඒ (අඩි 20ක් පළල පාර සඳහා වූ වෙන් කිරීම) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රමාණය රූ. 1 පර්. 25.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. වීරසේකර විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද වර්ෂ 2005ක් වූ ජනවාරි මස 31 වැනි දිනැති අංක 182 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, රාගම පදිංචි එන්දිරියන්වලගේ දිලිප් කුමාර එදිරිසිංහ යන අය පැහැර ඇති හෙයින්, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව, එකී දේපළ 2007 ක් වූ ජූලි මස 13 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2006 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.–*

*ගෙවීමේ ක්‍රමය.*–මිටිය පහත හෙළු විගස සාර්ථක ගැණුම්කරු විසින් පහත දැක්වෙන පරිදි ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ඉතිරි සියයට අනූව (90%) සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ දින 30ක් ඇතුළත තැන්පත් කළ යුතුය.
3. පළාත් සභා අයබදු සඳහා ගැණුම් මිලෙන් සියයට එකක් (1%),
4. වෙන්දේසිකරුගේ කොමිස් ගාස්තු සියයට දෙකයි දශම පහක් (2.5%),
5. මුළු ප්‍රචාරණ පිරිවැය සහ ඊට අමතරව අනෙකුත් සියලුම ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

වැඩි විස්තර සහ හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා අමතන්න. කළමණාකරු නීති, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 02.

දුරකතන අංක : 011-4313131.

ත්‍රිවංක සහ සේනානායක,
වෙන්දේසිකරුවෝ, බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණය
සහ කොළඹ දිසා අධිකරණය, බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, පළමු මහල,
හල්ස්ඩෝර්ෆ් වීදිය, කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංකය : 011-2388318.

06-354

---

## සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන විකිණීම

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරලේ, මැද්දේ මැදිලිය පත්තුවේ රඹුක්කන නගර සීමාවේ, ගැමුණු මාවත, දියසුන්නත හි පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් සාදන ලද වර්ෂ 1995 ක් වූ සැප්තැම්බර් මස 17 වන දිනැති අංක 453/95/කේ. ජී. පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන සියඹල-අත්තේපිල්ලැව යනුවෙන් හඳුන්වනු ලබන

ඉඩම් කැබැල්ල, ප්‍රමාණය අ. 0, රූ. 2, පර්. 0.2 එහි පිහිටි ගොඩනැගිලි සහ සියළුම දේ සමග වේ. කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඉහළගම විසින් සහතික කරන ලද්දා වූ ද සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද වර්ෂ 2003 ක් වූ නොවැම්බර් මස 17 වන දිනැති අංක 10723 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, රඹුක්කන පදිංචි ලංකාදේව ජානක ප්‍රියදර්ශන ද සිල්වා සහ ලලාජනී හේමාලි එදිරිසිංහ යන අය පැහැර ඇති හෙයින්, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව, එකී දේපල 2007 ක් වූ ජූලි මස 20 වන දින පෙ.ව.11.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.12.08 වන දින රජයේ *ගැසට් පත්‍රයද*, 2006.11.24 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.–* කුරුණෑගල නගරයේ සිට රඹුක්කන නගරය දෙසට කි. මී. 24 පමණ ගමන් කර වමට ඇති රෝහල පාරට හැරී තවත් මීටර 100 පමණ ගමන් කර වමට ඇති ගැමුණු මාවතට හැරී තවත් මීටර් 300 පමණ ගමන් කළ විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* මිටිය පහත හෙළු විගස සාර්ථක ගැණුම්කරු විසින් පහත දැක්වෙන පරිදි ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
2. ඉතිරි සියයට අනුව (90%) සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ දින 30 ක් ඇතුළත තැන්පත් කළ යුතුය.
3. පළාත් සභා අයබදු සඳහා ගැණුම් මිලෙන් සියයට එකක් (1%)
4. වෙන්දේසිකරුගේ කොමිස් ගාස්තු සියයට දෙකයි දශම පහක් (2.5%)
5. මුළු ප්‍රචාරණ පිරිවැය සහ ඊට අමතරව අනෙකුත් සියළුම ගාස්තුද
6. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500
7. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000

වැඩි විස්තර සහ හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා අමතන්න. කළමනාකරු - නීති, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 02.

දුරකතන අංකය : 011-4313131.

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු
බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණය
සහ කොළඹ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ, රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, පළමු මහළ, හල්ස්ඩ්‍රොෆ් විදිය,
කොළඹ 12,
දු.ක./ෆැක්ස් අංකය : 011-2388318.

06-355

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.